061

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන උපාධි පාඨමාලාව - තුන්වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2009
මූල්‍ය සහ පිරිවැය ගිණුම්කරණය - MCU1206

කාලය : පැය තුනයි

දිනය: 28.02.2009 වේලාව : ප. ව. 9.30 – මධ්‍යහන12.30

උපදෙස්

ප්‍රශ්න අංක එක **(01)** ඇතුළුව ප්‍රශ්න හතරකට **(04)** පමණක් පිළිතුරු ලියන්න. සියළු පෙර වැඩ පෙන්වන්න. වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කළ හැක.

01 අනිවාර්ය ප්‍රශ්නය

ගැමා සමාගමේ අනුදත් ප්‍රාග්ධනය රු 80,000,000/- කි. එය 5% එකක් රු 50/- බැගින් වන නිදහස් කළහැකි වරණීය කොටස් 600,000 කින් සහ රු 50/-බැගින් වූ සාමාන්‍ය කොටස් 1,000,000 කින් සමන්විතය. සමාගම මේ වන විට නිකුත් කොට ඇත්තේ නිදහස් කළහැකි වරණීය කොටස් 400,000 ක් සහ සාමාන්‍ය කොටස් 600,000කි.

ගැමා සමාගමේ 2008 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| ශේෂය | හර(000) | බැර(000) |
|---|---|---|
| සේවක වේතන | 3,500 | |
| අධ්‍යක්ෂ වේතන | 2,000 | |
| වෙළඳ ලාභය | | 128,000 |
| බොල්ණය | 3,000 | |
| ප්‍රචාරණය | 6,500 | |
| ගෙවූ / ලද කොමිස් | 1,250 | 2,100 |
| 2008. 03. 31 ට තොගය | 7,800 | |
| රක්ෂණය | 7,600 | |
| මුදල් සහ බැංකු | 11,000 | |
| ඉඩම් හා ගොඩනැගිලි/ 2007.01.04 ට ක්ෂය වෙන්කිරීම් | 75,000 | 25,000 |
| ලීබඩු සහ සවිකිරීම් / 2007.01.04 ට ක්ෂය වෙන්කිරීම් | 50,000 | 20,000 |
| ඇසුරුම් | 6,500 | |
| විගණන ගාස්තු | 1,250 | |
| ණය ගැතියෝ සහ ණය හිමියෝ | 43,000 | 33,000 |
| 15% ණයකර | | 22,000 |
| බැංකු ගාස්තු | 1,230 | |
| පොදු සංචිත | | 13,000 |
| ණයකර සඳහා ගෙවූ පොලී | 1,800 | |
| දුන් /ලද වට්ටම් | 670 | 1,100 |
| ජේමන්ට් සහ හිමිකම් | 4,500 | |
| ආරම්භක වියදම් | 1,500 | |
| දුරකථන | 5,000 | |
| නීති ගාස්තු | 800 | |
| කීර්තිනාමය | 13,200 | |

| | | |
|---|---|---|
| 13% මිල කල ආයෝජන | 25,000 | |
| 15% මිල නොකල ආයෝජන | 30,000 | |
| මිල නොකල ආයෝජන ආදායම් | | 2,500 |
| මිල කල ආයෝජන ආදායම් | | 3,000 |
| හිඟහිටි ඇරයුම | 15 | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 30000 |
| 5% වරණීය කොටස් ප්‍රාග්ධනය | | 20000 |
| 2007/08 ඇස්තමේන්තු වර්පය සඳහා ගෙවූ බදු | 2500 | |
| 2007. 04. 01 දිනට ලාභ අලාභ ගිණුමේ ශේපය | | 4,915 |
| | 304,615 | 304,615 |

පහත තොරතුරු දී ඇත.

- රු. 45,000/- ක් වන 2008 මාර්තු මාසයට අදාල දුරකථන බිලක් 2008 මාර්තු 31 වන තෙක් ගෙවා නොතිබුණි.

- ශේප පත්‍රයෙහි ඇති මුථ ණයගැතියන්ගෙන් රු. 500,000/- ක් බොල්ණය වන අතර ඉතිරියෙන් 10% ක් ණයගැතියන් සඳහා වෙන්කිරීම් ලෙස සැලකිය යුතුය.

- සමාගම ඔවුන්ගේ ජංගම නොවන වත්කම් පහත පරිදි ක්පය කරනු ලබයි.
  - ඉඩම් හා ගොඩනැගිලි 5% ක් ස්ථාවර ක්‍රමය මත
  - ලීබඩු හා සවිකිරීම් 10% ක හීන වන ශේප ක්‍රමය මත
- ඇසුරුම් වියදම් අතර ඇති රු.125,000 ක් වටිනා ද්‍රව්‍ය ඊලඟ මූල්‍ය වර්පය සඳහා භාවිතා කල හැකිය.

- 2008/03/31 වන විට හිඟ සහ ඉදිරියට කරන ලද වියදම් ලෙස ප්‍රචාරණ සහ රක්‍ෂණ වියදම් පිළිවෙළින් රු.500,000/- සහ රු.275,000/- ක් විය.

- 2007/2008 තක්සේරු වර්පය සඳහා ගෙවිය යුතු මුළු ආදායම් බදු මුදල රු.3500,000/-ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත.

- සාමාන්‍ය කොටස් 1500 ක් සඳහා හිඟහිටි ඇරයුමක් විය. මෙම කොටස් සඳහා ඇරයුම් කරන විට කොටසකට රු.10/- බැගින් වන ඇරයුම් මුදල ගෙවා නොතිබුණි. මෙම කොටස් අහිමි කොට එසැනින් රු.45/- බැගින් නැවත නිකුත් කිරීමට සමාගම තීරණය කරන ලදි. මේවා ගිණුම්වල ඇතුලත් කොට නැත.

- මූල්‍ය වසර අවසානයේදී පහත සඳහන් ගැලපීම් කිරීමට අධ්‍යක්‍ෂ මණ්ඩලය තීරණය කරන ලදි
  (1) පේටන්ට් සහ හිමිකම් සඳහා 50% ක් ලියා හරින්න.
  (2) පොදු සංචිතවල අගය 25%කින් ඉහළ දැමීමට
  (3) සාමාන්‍ය කොටස් සඳහා 5% ක ලාභාංශයක්ද, වරණීය කොටස් සඳහා නියමිත ලාභාංශ ප්‍රතිශතයද ප්‍රකාශ කිරීමට

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ඉදිරිපත් කිරීමට පහත දෑ පිළියෙල කරන්න.

- 2008 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා ගැමා පෞද්ගලික සමාගමේ ලාභ අලාභ ගිණුම
- ගැමා පෞද්ගලික සමාගමේ 2008 මාර්තු 31දිනට ශේෂ පත්‍රය

(ලකුණු 40)

02 විසිතුරු සැරසිලි විකිණීම සඳහා සුරේෂ් සහ රමේෂ් විසින් බද්ධ ව්‍යාපාරයක් 2008 දෙසැම්බර් මාසයේදී ආරම්භ කරන ලදි. ඒ අනුව සුරේෂ් විසින් සියළුම මිල දී ගැනීම් කොළඹින් සිදු කොට ඒවා ත්‍රිකුණාමලයේ ජීවත් වන රමේෂ් වෙත යවනු ලබයි. තවද ලාභ අලාභ සම සමව බෙදා ගැනීමට සුරේෂ් සහ රමේෂ් එකඟ වී ඇත.

පහත සඳහන් ගණුදෙනු ඔවුන්ගේ ව්‍යාපාරයේ සිදු වී ඇත

| | |
|---|---|
| 2008/12/01 | සුරේෂ් රු 32,000/- ක වටිනා සැරසිලි තොගයක් කොළඹින් මිල දී ගෙන රමේෂ් වෙත යවන ලදි. මේ සඳහා රු.3,500 /- ක ප්‍රවාහන වියදම් සුරේෂ් විසින් දරන ලදි. |
| 2008/12/05 | රමේෂ් විසින් මෙම භාණ්ඩ රු.45,000/- කට විකුණා රු.20,000/- ක අත්තිකාරම් මුදලක් චෙක්පතකින් සුරේෂ් වෙත යවන ලදි. |
| 2008/12/06 | රු.3,000/-ක විකුණුම් වියදම් රමේෂ් විසින් දරන ලදි. |
| 2008/12/09 | තවත් රු.45,000/- ක් වටිනා සැරසිලි තොගයක් සුරේෂ් විසින් මිලදී ගෙන රු.4,200/- ක ප්‍රවාහන වියදමක් දරා රමේෂ් වෙත යවන ලදි. |
| 2008/12/10 | රමේෂ් මෙම තොගය රු.70,000/- කට විකුණන ලදි රමේෂ් විසින් කරන ලද මුළු විකුණුම්වලින් රු.3,500/- ක ඉන්වොයිස් අගයක් ඇති භාණ්ඩ පාරිභෝගිකයන් විසින් ආපසු එවා ඇත. |
| 2008/12/11 | රමේෂ් විසින් රු.15,000/-කට ණයට අලෙවි කරන ලද විසිතුරු භාණ්ඩ සඳහා රු.13,000/-ක් පමණක් ණයගැතියන්ගෙන් අය කර ගැනීමට හැකි විය. ඉතිරිය බොල්ණය බවට පත් විය. |
| 2008/12/12 | රු.3,500/-ක් වටිනා භාණ්ඩ රමේෂ් විසින් තම පුද්ගලික පාරිභෝජනය සඳහා යොදා ගන්නා ලදි. |

ව්‍යාපාරය සමාප්ත කිරීමට දෙදෙනා තීරණය කරන ලදි. රමේෂ් විසින් සියම වියදම් සහ තම ලාභ කොටස අඩු කොට ගෙන ඉතිරි මුදල සුරේෂ් වෙත යවන ලදි.

ඉහත තොරතුරුවලට අනුව සුරේෂ් සහ රමේෂ් අතර බද්ධ ව්‍යාපාරයේ පහත ගිණුම් පිළියෙල කරන්න.

- බද්ධ ව්‍යාපාර සිහිවටන ගිණුම
- රමේෂ්ගේ පොත්වල සුරේෂ් සමග බද්ධ ව්‍යාපාර ගිණුම
- සුරේෂ්ගේ පොත්වල රමේෂ් සමග බද්ධ ව්‍යාපාර ගිණුම

(ලකුණු 20)

03 "ශ්‍රීලා ට්‍රේඩර්ස්" බයිසිකල් ආනයනය කොට ලංකාව පුරා විකුණනු ලබයි. "ශ්‍රීලා ට්‍රේඩර්ස්" ඔවුන්ගේ විකුණුම් කටයුතු නුවර දිස්ත්‍රික්කයේ සිදු කිරීම සඳහා "මනෝජ් ට්‍රේඩර්ස්" ඔවුන්ගේ නියෝජිතයා ලෙස පත් කරන ලදී. 2008/12/31 න් අවසන් වර්ෂය සඳහා විකුණුම් සම්බන්ධයෙන් සිදු වූ ගණුදෙනු පහත දී ඇත.

"ශ්‍රීලා ට්‍රේඩර්ස්" එකක් රු.6,500/-ක් පිරිවැය වූ බයිසිකල් 125ක් මනෝජ් වෙත යවන ලදී. මෙම බයිසිකල් එකක් රු.8,500/-ක් බැගින් වූ මිලකට අලෙවිකරන ලෙස "ශ්‍රීලා ට්‍රේඩර්ස්" "මනෝජ් ට්‍රේඩර්ස්" වෙත පවසන ලදී. "ශ්‍රීලා ට්‍රේඩර්ස්" විසින් බයිසිකල් තොග මනෝජ් ට්‍රේඩර්ස් වෙත යැවීමේදී පහත වියදම් දරා ඇත.

- එක් බයිසිකලයකට රු. 200/- බැගින් වූ ඇසුරුම් පිරිවැයක
- රු.18,750/-ක මුළු ප්‍රවාහන වියදම්

බඩු තොග ලද විගසම මනෝජ් විසින් රු. 2,500/-ක ප්‍රවාහන පිරිවැයක් දරා භාවිතා කල නොහැකි තත්ත්වයේ බයිසිකල් 10 ක් ආපසු එවන ලදී. මේ සඳහා දරන ලද ප්‍රවාහන පිරිවැය ශ්‍රීලා ට්‍රේඩර්ස් විසින් භාර ගන්නා ලදී.

බඩු තොග භාර ගැනීමෙන් අනතුරුව, පහත වියදම් මනෝජ් විසින් දරන ලදී.

- එක් බයිසිකලයකට රු. 170/- බැගින් වූ ගබඩා සහ නඩත්තු වියදම්
- රු.7,500/- ක් වූ විකිණීමේ සහ බෙදාහැරීමේ වියදම්

මුළු විකුණුම්වලින් 7%ක කොමිස් මුදලක් මනෝජ්ට හිමිවේ. මූල්‍ය වර්ෂය අවසාන වන විට මනෝජ්ට විකිණීමට හැකි වූයේ නියම කල මිලට බයිසිකල් 100ක් පමණක් වන අතර ඉතිරි බයිසිකල් මනෝජ් ට්‍රේඩර්ස් හි ගබඩා කොට තිබිණි.

දී ඇති තොරතුරු තොරතුරු අනුව "ශ්‍රීලා ට්‍රේඩර්ස්" හි පොත්වල පහත ගිණුම් පිළියෙල කරන්න.

- නියෝජන ගිණුම
- නියෝජිත (මනෝජ් ට්‍රේඩර්ස්) ගිණුම

(ලකුණු 20)

04 අමල්, බාලා සහ කමල් විසින් ලාභ අලාභ සම සමව බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක් කරගෙන යන ලදී. 2008 සැප්තැම්බර් 30 දාට බලපවත්වන පරිදි මෙම ව්‍යාපාරය විසුරුවා හැරීමට හවුල් කරුවන් එකග වී ඇත. 2008 සැප්තැම්බර් 30 දිනට ඔවුන්ගේ ශේෂ පත්‍රය පහත පරිදි විය.

| **ප්‍රාග්ධන ගිණුම** | රු.. | | **ජංගම නොවන වත්කම්** | රු.. |
|---|---|---|---|---|
| අමල් | 300,000 | | ඉඩම් හා ගොඩනැගිලි | 680,000 |
| බාලා | 300,000 | | ලීබඩු හා සවිකිරීම් | 250,000 |
| කමල් | 300,000 | | | 930,000 |
| | 900,000 | | කීර්තිනාමය | 120,000 |
| පොදු සංචිත | 30,000 | | | |
| **ජංගම ගිණුම්** | රු. | | **ජංගම වත්කම්** | |
| අමල් | 25,000 | | තොග | 30,000 |
| බාලා | 32,000 | | වෙළඳ ණයගැතියෝ | 42,000 |
| කමල් | (12,000) | | මුදල් | 25,000 |
| | 45000 | | | |
| 10% බැංකු ණය | 120,000 | | | |
| **ජංගම වගකීම්** | | | | |
| ණය හිමියෝ | 30,000 | | | |
| ගෙවිය යුතු බිල් | 22,000 | | | |
| | 1,147,000 | | | 1,147,000 |

තවද පහත තොරතුරු දී ඇත.

1. ජංගම නොවන වත්කම් පහත පරිදි උපලබ්ධි කරන ලදි
   ඉඩම් සහ ගොඩනැගිලි රු. 800,000/-
   ලීබඩු සහ සවිකිරීම් රු. 180,000/- (කොටසක් විකුණන ලදි)

2. ශේෂ පත්‍රයේ සඳහන් අගයට වඩා 10% ක් අඩුවෙන් තොග උපලබ්ධි කර ගත හැකි විය.

3. වෙළඳ ණයගැතියන්ගෙන් රු. 2000/- ක් අය කර ගත නොහැකි වූ අතර ඉතිරි ණයගැතියන් ඔවුන්ගේ මුදල ගෙවන ලදි.

4. 2008 ජූලි 01 සිට 2008 සැප්තැම්බර් 30 වන තෙක් තුන් මසකට අදාළ හිඟ පොලී මුදල් ද සමග බැංකු ණය සම්පූර්ණයෙන් පියවා දමන ලදි.

5. 10% ක වට්ටමක් ලබමින් ණයහිමියන් පියවා දමන ලද අතර ගෙවිය යුතු බිල් එහි නාමික අගයටම ගෙවා දමන ලදි.

6. රු. 100.000/- කට ඇස්තමේන්තු කරන ලද ලී බඩු බාලා විසින් ඔහුට ලැබිය යුතු අගයෙන් කොටසකට පවරා ගැනීමට එකඟ විය.

7. රු. 15.000/- ක විසුරුවා හැරීමේ වියදම් දරන ලදි.

8. සියළුම ගෙවීම් හවුල් කරුවන් අතර මුදලින් සිදු වුනි.

හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීම සඳහා පහත ගිණුම් පෙන්වන්න.

- උපලබ්ධි ගිණුම
- හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්
- මුදල් ගිණුම

(ලකුණු 20)

05 කළමනාකරණ තීරණ ගැනීම සඳහා පිරිවැයකරණය ඉතා වැදගත් ලෙස සැලකේ පිරිවැය ගිණුම්කරණය පිළිබඳ ඔබගේ දැනුම භාවිතා කොට පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i බහුල වශයෙන් භාවිතා වන තොග ඇගයීමේ ක්‍රම 2ක් විස්තර කරන්න.
ii ඔතැම පොදු කාර්ය අන්තර්ග්‍රහන අනුපාත 2ක් සාකච්ඡා කරන්න.
iii එක් දිරි දීමනා ක්‍රමයක් කෙටියෙන් පැහැදිලි කරන්න.
iv කාර්ය (job) පිරිවැයකරණය පෙරසැරි (Process) පිරිවැයකරණයෙන් වෙන් කොට දක්වන්න.

(ලකුණු 20)

\- හිමිකම් ඇවිරිණි -